# සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - දකුණු පළාත
சுகாதார சேவைத் திணைக்களம் - தென் மாகாணம்
Department of Health Services - Southern Province

අංක 15 ඒ, පහළ ඩික්සන් පාර, ගාල්ල, ශ්‍රී ලංකාව.
15ஏ,கீழ டிக்ஸன் பாதை,காலி,ஸ்ரீ லங்கா.
No. 15A, Lower Dickson Rd, Galle. Sri Lanka.

E-mail : pdhssp@yahoo.com
Web : www.healthdept.sp.gov.lk
Skype : Pdhs.sp


මගේ අංකය / My No. SPH/EST/EA/03/.08/2022 ඔබේ අංකය / Your No. දිනය / Date 2022.09. 12

දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ගාල්ල/මාතර/හම්බන්තොට.

වෛද්‍ය අධිකාරී,මූලික රෝහල,
බලපිටිය/ඇල්පිටිය/උඩුගම/දෙනියාය/කඹුරුපිටිය/තංගල්ල/ වලස්මුල්ල/තිස්සමහාරාම.

සියළුම ආයතන ප්‍රධානීන්,

## වාර්ෂික ස්ථාන මාරු - 2022
## දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව.

දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ 2022 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ . අභියාචනා මණ්ඩලයේ නිර්දේශ මත සකසන ලද අභියාචනා මණ්ඩල තීරණ(පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී හැර) මෙම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.healthdept.sp.gov.lk) වෙත මුදාහැර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

02.මෙම අභියාචනා මණ්ඩල තීරණ පිළිබඳව අදාල සියළුම නිලධාරීන් දැනුවත් කිරීම ආයතන ප්‍රධානීන් විසින් සිදුකල යුතු අතර ඒ සම්බන්ධව ඔවුන් පෞද්ගලිකව වගකීමට බැඳෙන බවද දන්වා සිටිමි. කඩදාසි භිගය හා පිරිවැය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් අභියාචනා මණ්ඩල තීරණ සියළුම ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් වෙත සෘජුව යොමු නොකොට වෙබ් අඩවියේ පමණක් පල කිරීමට තීරණය කල බවද වැඩි දුරටත් සඳහන් කරමි.

03.දකුණු පළාත් සභාවේ සියළුම 2022 වාර්ෂික ස්ථාන මාරු 2022.10.03 දින සිට ක්‍රියාත්මක කරන ලෙස ,දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSS/03/06/03/04/2022(43) හා 2022.09.05 දිනැති ලිපියෙන් දන්වා ඇති නමුත් මෙම දෙපාර්තමේන්තුවේ ඇතැම් තනතුරුවල අභියාචනා මණ්ඩල වල කටයුතු මෙතෙක් අවසන් කර නොමැති බැවින් හා ඇතැම් තනතුරුවල විශ්‍රාම ගැන්වීමේ වයස දීර්ඝ කිරීමේ තීරණය නැවත බලාත්මක කිරීමට කටයුතු කෙරෙමින් පවතින බැවින්, මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථානමාරු 2023.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට අවසර ලබාදෙන ලෙස මගේ අංක SPH/EST/EA/01/03/01/2022 හා 2022.09.07 දිනැති ලිපියෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙතින් ඉල්ලීම් කරනු ලැබූ බවද සඳහන් කරමි.

04.ඒ අනුව සියළුම දෙපාර්තමේන්තුගත තනතුරු වලට අදාල වාර්ෂික ස්ථානමාරු නියෝග, ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව 2023.01.01 දින සිට ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දැනුම්දෙන අතර ප්‍රධාන ලේකම්ගේ උපදෙස් පරිදි එකී තීරණයේ යම් වෙනසක් සිදුවුහොත් ඒ පිළිබඳව ඉදිරියේදී දැනුම් දීමට කටයුතු කරන බව ද දන්වා සිටිමි.

05.තවද පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී තනතුරු සඳහා වන අභියාචනා මණ්ඩල තීරණ ඉදිරියේදී දැනුම් දීමට කටයුතු කරන බවද සඳහන් කරමි.

06.ඒ අනුව මෙහි සඳහන් සියළු ස්ථානමාරු හා අභියාචනා මණ්ඩල තීරණ ආයතන ප්‍රධානීන් විසින් අදාල නිලධාරීන් වෙත විධිමත් ලෙස දැන්විය යුතු බවත් ඒ අනුව අදාල ස්ථාන මාරු ක්‍රියාත්මක කල යුතු බවත් සියළු ආයතන ප්‍රධානීන් ඒ සඳහා පෞද්ගලිකව වගකීමට බැඳී සිටින බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

විශේෂඥ වෛද්‍ය චන්දිම සිරිතුංග
දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

විශේෂඥ වෛද්‍ය චන්දිම සිරිතුංග
එම්.බී.බී.එස්, එම්.එස්.සී.එම්.ඩී.(ප්‍රජා වෛද්‍ය)
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
දකුණු පළාත

පිටපත් :-
1. දකුණු පළාත් ප්‍රධාන ලේකම් - කා.දැ.පි. හා අ.ක.ස
2. දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් -කා.දැ.පි
3.වෘත්තීය සමිති නියෝජිතයන්ට -කා.දැ.පි


කාර්යාලය / Office
දුරකථන : +94 91 2246739
+94 91 2231620
ෆැක්ස් : +94 91 2246740

අධ්‍යක්ෂ / Director : +94 91 2234980
නි.අධ්‍යක්ෂ (පාලන) / Deputy Director (Admin) : +94 91 2223840

පරිපාලන නිලධාරි / Administrative Officer : +94 91 2223839
ප්‍රධාන ගණකාධිකාරි / Chief Accountant : +94 91 2224609

සැළසුම් ඒකකය / Planing Unit : +94 91 2225691
ගණකාධිකාරි : +94 91 2233085